සැ.යු.- 2017.05.12 දින පළ වූ අංක 2019 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,020 - 2017 මැයි මස 19 වැනි සිකුරාදා - 2017.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 864 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | 872 |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 867 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 876 |


සැ. යු. - (i) ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මැයි මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මැයි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජූනි මස 09 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මැයි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පූජාපිටිය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | 3/2016 - PL– 02<br>රු.25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450. | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයන් 06කින් විෂයන් 2කට සම්මාන සහිතව සාමාර්ථ ලබා තිබිය යුතුය. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවාගැනීම කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම ක්‍රමයට දායක විය යුතුය.
ii. එසේ රාජ්‍ය සේවා පත් කිරීම අදළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
iii. තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, මේ කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම, සතුටුදයක තත්වයක් නොමැති වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

04. *වෙනත් පොදු කොන්දේසි :-*

i. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

ii. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනීගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

v. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අඛණ්ඩව වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචි ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

vi. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙක් නොවිය යුතුය.

vii. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබා ගත්තා වූද, සතුටුදයක සේවා කාලයක් තිබිය යුතුය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුය.

viii. මෙම බඳවාගැනීම් කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට, මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, මධ්‍යම පළාත් සභාව හෝ පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි සහ නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

05. *අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2017 ජුනි 12 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, පූජාපිටිය ප්‍රාදේශීය සභාව, පූජාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය.) අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළයුතුය.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික
iii. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය
iv. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
v. සේවා සහතික (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි)

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම සංශෝධනය කිරීම ආදී සියලු බලතල පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

සී. අමදෝරු,<br>ලේකම්,<br>පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

2017 මැයි මස 03 වැනි දින,<br>පූජාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

***පූජාපිටිය ප්‍රාදේශීය සභාව***

*.......................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. මුලකුරු සමග නම :—————.

   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

2. ස්ථිර ලිපිනය :—————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
5. උපන් දිනය : අවුරුද්ද :—————. මාසය:—————.- දිනය :—————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :අවුරුදු:—————. මාස:—————.- දින :—————.
7. ස්ත්‍රී/පුරුෂ බව :—————.
8. විවාහක /අවිවාහක බව :—————.
9. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග :—————.
10. අධ්‍යාපන සුදුසුකම්

    (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

අ.පො.ස. සා. පෙළ විභාගය :

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 5 | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

11. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :--------------------
(ii) වෘත්තීය සුදුසුකම් :--------------------
(iii) සේවා පළපුරුද්ද :--------------------

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක යන වග :

එම තනතුරට පත් වූ දිනය :--------------------

13. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු බව සහ පත් වීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

..............................,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ........................................කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළහැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.

තනතුර :————.

ආයතනය :————.

දිනය :————.

05-627

# පළාත් පාලන නිවේදන

## සොරණාතොට ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වැනි අධිකාරය වූ) 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව. ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථා මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට ක්‍රියාත්මක කිරීමට, වැළඳගත් බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එල්. ජී. ආර්. ශාන්තිලතා,
සභා ලේකම්,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 26 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-418

---

## වැලිගම ප්‍රාදේශීය සභාව

### වාර වාර්තා සපයන ලෙස නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වැලිගම ප්‍රාදේශීය සභාව විසින් 2017.04.03 වැනි දින තීරණ අංක 274:1 යටතේ මෙහි පහත සඳහන් තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිලන්ති වික්‍රමරත්න ගුණසේකර.
ලේකම් *(වැ. බ.),*
වැලිගම ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැළසුම් කිරීම පහසු කිරීමට සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වැනි සහ 5 වැනි වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහාද, එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් වැලිගම ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති එකී ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මම මෙයින් තීරණය කරමි.

05-421

**මාතලේ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මාතලේ ප්‍රාදේශීය සභාව විසින් 2017.03.27 දින තීරණ අංක 34 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. ටී. බී. හින්කෙන්ද,
ලේකම්,
මාතලේ ප්‍රාදේශීය සභාව.

2017 මාර්තු මස 28 වැනි දින,

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම පහසු කිරීමක් සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වන සහ 5 වන වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහා ද, එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි, මාතලේ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.".

05-688

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එම උපලේඛනයේ සඳහන් ස්ථානයෙහි 2017 වර්ෂයට ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පතක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙන ද යන්න පිළිබඳ විස්තර, ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළවූ ද සිට දින 14ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
වාරියපොල.

2017 අප්‍රේල් මස 26 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ගෝඝාතකාගාරය ඉදි කිරීමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|
| 01. යූනුස් ලෙබ්බේ මොහොමඩ් ලාපීර් මයා | 2015.08.03 දිනැති පිඹුරුපත් අංක 2015/327 හා ඔප්පු අංක 2652 දරන හේන්ගෙදර ගමේ පිහිටි මකුල්ලගහමුල වත්ත නමැති ඉඩමේ ලොට් අංක 02 දරන රූඩ් 02 පර්චස් 01.40ක් විශාල ඉඩම |

05-435

**අකුරණ ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ගෝසාතක ආඥාපනත

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂයේ අප්‍රේල් මස 28 වැනි දින තීරණ පොතෙහි තීරණ අංක 2013/2017 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන ගවමස් වෙළෙඳසලක් පවත්වාගෙන යාමට ගෝසාතක ආඥාපනතේ 07(1) වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලෙස අකුරණ ප්‍රාදේශීය සභාවේ නිසි බලධාරියා වන මා වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබේ.

පහත උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි ගවමස් වෙළෙඳසලක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධත්වයක් දක්වන්නන් වෙතොත් එසේ විරුද්ධත්වයට දැක්වීමට හේතු සඳහන් කරමි මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට සති 04 ක් ගෙවීමට මත්තෙන් පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන ලෙස අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එස්. රාජපක්ෂ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2017 මැයි මස 02 වැනි දින,
අලවතුගොඩ,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ගවමස් වෙළෙඳ සල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය* |
|---|---|---|
| 01 | කේ. එම්. පී. ඒ. සී. මොහොමඩ් මුහුසීන් මයා. | අංක 274 , කුරුඳුගහඇළ. මාතලේ පාර, අකුරණ |

05-601/1

---

**විල්ගමුව ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, විල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. ජී. ඒ. යූ. විජේරත්න,
ලේකම්,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 06 වැනි දින,

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.".

05-476

**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2017.04.03 දින තීරණ අංක 1732 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. ගුණසේකර,
ලේකම්,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 03 වැනි දින.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැළසුම් කිරීම පහසු කිරීමත් සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වැනි සහ 5 වැනි වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහා ද එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

05-517

---

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 නොවැම්බර් මස 04 වැනි දින අංක 1,992 දරන පළාත් සභා *ගැසට් පත්‍ර* මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට් පත්‍රය* මගින් ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, එම *ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස දැනුම් දී ඇත.

එහෙත් එම කාලසීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකර නොමැති බැවින්, එකී *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී පහත උපලේඛනයේ සඳහන් මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්ලිව්. ඒ. එල්. තුෂාරි ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

ඇඹිල්මීගම,
පිළිමතලාව,
යටිනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| අනු අංකය | මාර්ගයේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | දිග | පළල | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | පේරගොල්ල වත්ත අතුරු මාර්ගය | අංක 586 පිඹුරේ කැබලි අංක 15(වම) කැබලි අංක 18 (දකුණ) | අංක 586 පිඹුරේ කැබලි අංක 4 (වම) කැබලි අංක 5 (දකුණ) | 01. එස්. පී. එස්. හත්තොටුව<br>02. ආර්. ඩී. එම්. ඒ. දිසානායක<br>03. කේ. ඩී. පී. ජේ. සේපාල<br>04. ඒ. එන්. එම්. මාලියද්ද<br>05. ජේ. හෙට්ටිආරච්චි<br>06. ටී. ජී. එස්. බී. වික්‍රමරත්න | 01. එස්. පී. ජී. පොඩිසිංඤෝ<br>02. එස්. පී. ජී. එන්. චන්ද්‍රකාන්ති<br>03. ආර්. ඩී. ඇසිලින් රාජපක්ෂ<br>04. ඩබ්. ජී. රණසිංහ<br>05. එස්. ජී. සුනිල් ගාමිණී<br>06. කේ. ජී. සුගතපාල<br>07. කුසුම් ඉලංගවීර<br>08. ඩී. ඩබ්. ජී. චන්ද්‍රාප්‍රියලතා<br>09. අයි. ජී. සිසිල් චන්ද්‍ර | මී 180 | මී 3 | 586 |
| 02 | උනුමුවේ පාර | දෙහිදෙණිය ගොරකදෙණිය පාර | නාගහවිල වත්ත | 01. එම්. කේ. ජී. නන්දවතී<br>02. ඩී. ඇම්. ගුණදස<br>03. පී. ජී. සෝමාවතී<br>06. ඩග්ලස් සේවියර්<br>07. ආර්. මැනුවෙල් | 01. ඩබ්. ඒ. ජී. විමල් පේමසිරි | මී 500 | මී 3 | 4148 ඒ |

05-419/1

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත්වලින් කොටසක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත්, යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්ලිව්. ඒ. එල්. තුෂාරි ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| අනු අංකය | මාර්ගයේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | දිග | පළල | පිඹුරු පත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | පිහිල්ලදෙණිය නොහොත් හැවැන්දෙණිය පාර | වෙලේකඩේ නවම්පැල සිට | පිහිල්ලදෙණිය | 01. ඩබ්. ජී. ජේ. බී. හැවැන්දෙණිය<br>02. ජයසිංහ බණ්ඩාර<br>03. සුනේත්‍රා ජයසිංහ<br>04. එන්. එස්. ඉලංගසේකර<br>05. එච්. ජී. අබේගුණසේකර<br>06. එන්. එස්. ගුණරත්න<br>07. ටී. එම්. ආර්. ජයසිංහ<br>08. එච්. පී. ස්වර්ණා<br>09. ආර්. ජී. ඒ. එන්. ගුණරත්න<br>10. රුවන් චාමර ජයසිංහ | 01. එච්. බී. ජයතිලක<br>02. සුරංගි ජයසිංහ<br>03. ඩබ්. එම්. ප්‍රේමලතා | මී 670 | මී. 2.43-3.6 අතර | 8699 |
| 02 | මෙරලියාව පාර | එල්. බී. වීරසේකර මයාගේ නිවස (ශ්‍රී ප්‍රේමරත්න මාවත) | ඩී. කේ. වීරසේකර මයාගේ නිවස | 01. ඩබ්. එම්. එල්. බී. වීරසේකර<br>02. ඩබ්. එම්. පී. බී. වීරසේකර<br>03. ඩබ්. එම්. කේ. බී. වීරසේකර<br>04. ඩබ්. එම්. සී. බී. වීරසේකර<br>05. ඩබ්. එම්. ඩී. කේ. වීරසේකර | 01. ඩබ්. එම්. එල්. බී. වීරසේකර<br>02. ඩබ්. එම්. පී. බී. වීරසේකර<br>03. ඩබ්. එම්. කේ. බී. වීරසේකර<br>04. ඩබ්. එම්. සී. බී. වීරසේකර<br>05. ඩබ්. එම්. ඩී. කේ. වීරසේකර | මී 300 | මී 3.00 | 6330 |

05-419/2

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**වාරියපොළ ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා රීති 167 ප්‍රකාරව වාර්ෂික මූල්‍ය වාර්තාව ප්‍රකාශයට පත්කිරීම

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ 2016.12.31 දිනට අදාල මුල්‍ය වාර්තාව (ශේෂ පත්‍රය) මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට ම විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එහි ශේෂ පත්‍රය පහත පරිදිය.

වයි. එම්. සේනානායක,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
වාරියපොළ ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 27 වැනි දින,
වාරියපොළ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය ：

### වාරියපොළ ප්‍රාදේශීය සභාව

### 2016.12.31 දිනට ශේෂ පත්‍රය (රු.)

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් (සටහන 01) | | 336,369,535.88 | | 286,861,157.18 |
| ජංගම වත්කම් | | | | |
| අතැති තොග (සටහන 02) | 8,255,138.11 | | 3,034,971.28 | |
| උපයෝගී සේවා සඳහා ණය (සටහන 03) | 352,647.80 | | 80,717.80 | |
| සේවක ණය | 6,803,357.48 | | 5,883,720.80 | |
| අයකරගත හැකි උපයෝගි සේවා (සටහන 04) | 0.00 | | 0.00 | |
| ආදයම් ණය ගැතියෝ (සටහන 05) | 137,973,685.38 | | 76,606,340.01 | |
| පෙර ගෙවුම් (සටහන 06) | 1,914,469.35 | | 674,023.04 | |
| ආයෝජන (සටහන 07) | 58,185,3015.10 | | 54,408,701.38 | |
| මුදල් (සටහන 08) | 15,163,951.79 | | 13,463,880.97 | |
| **ජංගම වත්කම් එකතුව** | **228,648,555.01** | | **154,152,355.28** | |
| **අඩු කලා - ජංගම වගකීම්** | | | | |
| ණය හිමියෝ (සටහන 09) | 97,289,061.72 | | 55,230,566.35 | |
| කලින් ලැබීම් (සටහන 10) | 197,737.41 | | 172,095.37 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු (සටහන 11) | 8,242,687.29 | | 6,566,071.17 | |
| **ජංගම වගකීම් එකතුව** | **105,729,486.42** | | **61,968,732.89** | |
| කාරක ප්‍රාග්ධනය/ඍණකාරක ප්‍රාග්ධනය (2-3) | | **122,919,068.59** | | **92,183,622.39** |
| **ශුද්ධ වත්කම්** | | **459,288,604.47** | | **379,044,779.57** |
| මුදල් යොදවන්නේ | | | | |
| සමුච්චිත අරමුදල හා සංචිත (සටහන 12) | | 447,233,491.56 | | 365,647,320.11 |
| ණය ප්‍රාග්ධනය (සටහන 13) | | 12,055,112.91 | | 13,397,459.14 |
| **එකතුව** | | **459,288,604.47** | | **379,044,779.25** |

### වාරියපොළ ප්‍රාදේශීය සභාව

### 2016.12.31 දිනට ශේෂ පත්‍රය (රු.)

| **සටහන් 01** | **2016.12.31 පිරිවැය** | **2015.12.31 පිරිවැය** |
|---|---|---|
| **110. ස්ථාවර වත්කම්** | | |
| 111. ඉඩම් හා ගොඩනැගිලි | 232,302,212.00 | 191,423,212.00 |
| 112. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3,778,342.60 | 3,272,342.60 |
| 113. මෝටර් රථ හා කරත්ත | 71,108,515.65 | 68,169,253.65 |
| 114. ලී බඩු සවි කිරීම් | 9,925,316.55 | 7,036,216.55 |
| 115. පුස්තකාල පොත් | 11,078,008.79 | 10,656,612.09 |
| 116. කාර්යාල උපකරණ | 8,177,140.29 | 6,303,520.29 |
| **එකතුව** | **336,369,535.88** | **286,861,157.18** |

| | 2016.12.31 පිරිවැය<br>රු. ශත | 2015.12.31 පිරිවැය<br>රු. ශත |
|---|---|---|
| සටහන් 02 | | |
| 120. අතැති තොග | | |
| 121. පොදු ගබඩාව | 5,571,294.04 | 1,777,247.92 |
| 122. ලිපි ද්‍රව්‍ය ගබඩාව | 370,067.07 | 297,280.36 |
| 123. කොන්ක්‍රීට් අමුද්‍රව්‍ය ගබඩාව | 262,232.00 | 107,910.00 |
| 124. කොන්ක්‍රීට් නිම්තොග | 394,296.00 | 852,533.00 |
| 125. කර්මාන්ත ගබඩාව | 1,657,249.00 | |
| **එකතුව** | **8,255,138.11** | **3,034,971.28** |
| සටහන් 03 | | |
| 130. උපයෝගී සේවා සඳහා ණය | | |
| 131. බ්ලොක් ගල් ව්‍යාපෘතිය | 294,430.00 | 22,500.00 |
| 132. ආධාර නිවාස ජලාපවාහන | 58,217.80 | 58,217.80 |
| 133. ජරාවාස ගොඩනැගිලි නඩත්තුව | - | - |
| 134. පුද්ගලික වීථිවල ජලනල යෙදීම | - | - |
| **එකතුව** | **352,647.80** | **80,717.80** |
| සටහන් 04 | | |
| 150. අයකරගත හැකි උපයෝගි සේවා | | |
| 151. අය කිරීමට තිබෙන වැඩ | 0.00 | 0.00 |
| 152. තොගය සඳහා උපකරණ තැනීම | 0.00 | 0.00 |
| 153. විවිධ | 0.00 | 0.00 |
| **එකතුව** | **0.00** | **0.00** |
| සටහන් 05 | | |
| 160. ආදායම් ණය ගැතියෝ | | |
| 161. හිඟ හිටි වරිපනම් | 580,894.14 | 1,182,080.29 |
| 162. හිඟ හිටි අක්කර බදු | 110,633.73 | 102,729.58 |
| 163. හිඟ හිටි කුලී ආදායම් ගිණුම | 90,335.00 | |
| 164. හිඟ හිටි සේවා සඳහා ගාස්තු | 53,300.00 | |
| 165. හිඟ හිටි වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 1,534,950.00 | |
| 166. හිඟ හිටි වෙනත් ආදායම් | 25,297,815.00 | 45,451,321.98 |
| 167. හිඟ හිටි ආදායම් ආධාර | 8,028,479.74 | |
| 164. හිඟ හිටි ප්‍රාග්ධන ආදායම් | 102,113,027.77 | 24,016,978.16 |
| 165. හිඟ හිටි කී මනි | 0.00 | 5,853,230.00 |
| 166. නඩු ගිණුමෙහි ශේෂය | 164,250.00 | |
| **එකතුව** | **137,973,685.38** | **76,606,340.01** |

| | 2016.12.31 පිරිවැය | 2015.12.31 පිරිවැය |
|---|---|---|
| සටහන් 06 | | |
| 170. පෙර ගෙවුම් | | |
| 171. සභාව විසින් තැන්පත් | 0.00 | 0.00 |
| 172. අත්තකාරම් සාමාන්‍ය | 1,914,469.35 | 674,023.04 |
| 173. අගරු චෙක්පත් | 0.00 | 0.00 |
| **එකතුව** | **1,914,469.35** | **674,023.04** |
| සටහන් 07 | | |
| 180. ස්ථාවර තැන්පත් | | |
| 181. ස්ථාවර තැන්පත් වල ඇති සභාවේ මුදල් | 57,892,672.89 | 54,115,796.30 |
| 182. අත්තිකාරම් සාමාන්‍ය | 292,632.21 | 292,905.08 |
| 183. නිදහස් අරමුදල් | 0.00 | 0.00 |
| 184. වෙනත් | 0.00 | 0.00 |
| **එකතුව** | **58,185,305.10** | **54,408,701.38** |
| සටහන් 08 | | |
| 190. මුදල් | | |
| 191. ව්‍යාපෘති ගිණුම | 440,650.10 | 229,712.54 |
| 192. 615 ගිණුම | 500.00 | 500.00 |
| 193. 612 ගිණුම (සාමාන්‍ය) | 6,691,076.15 | 3,079,420.64 |
| 194. 614 ගිණුම (කර්මාන්ත) | 7,485,400.40 | 8,941,083.68 |
| 195. මුදල් ගිණුම (සේවක ණය) | 546,325.14 | 1,213,164.11 |
| **එකතුව** | **15,163,951.79** | **13,463,880.97** |
| සටහන් 09 | | |
| 230. ණය හිමියෝ | | |
| 231. වියදම් ණය හිමියෝ (සාමාන්‍ය) | 1,369,343.52 | 1,207,280.93 |
| 232. ණය හිමියෝ (කර්මාන්ත) | 91,105,483.73 | 50,058,488.99 |
| 233. සැපයුම් ණය හිමියෝ | 1,377,930.00 | 651,242.98 |
| 234. විදුලිය සැපයුම් ණය හිමියෝ | - | - |
| 235. නොගෙවූ වැටුප් හා වේතන | 412,526.51 | 268,178.09 |
| 236. වෙනත් (ගෙවිය යුතු විශ්‍රාම වැටුප්) | 3,023,777.96 | 3,045,375.36 |
| **එකතුව** | **97,289,061.72** | **55,230,566.35** |
| සටහන් 10 | | |
| 240. කලින් ලැබීම් | | |
| 241. කලින් ලද ආදයම් | 197,737.41 | 172,095.37 |
| 242. අවිනිශ්චිත ගිණුම | - | - |
| **එකතුව** | **197,737.41** | **172,095.37** |
| සටහන් 11 | | |
| 250. ආපසු ගෙවිය යුතු තැන්පතු | | |
| 251. සේවක ඇප තැන්පත් | 292,632.21 | 297,905.08 |
| 252. ආදයම් වෙනුවෙන් තැන්පත් | - | - |

| | 2016.12.31 පිරිවැය | 2015.12.31 පිරිවැය |
|---|---|---|
| 253. ටෙන්ඩර් තැන්පත් | 1,983,616.60 | 2,438.209.60 |
| 254. ගිවිසුම් ඇප (ආරක්ෂිත) | 886,300.00 | 591,500.00 |
| 255. පුස්තකාල තැන්පත් | 578,072.25 | 534,769.00 |
| 256. ගෙවල් කුලී තැන්පත් | 25,741.16 | 25,741.16 |
| 257. විවිධ තැන්පත් | 681,808.32 | 726,691.64 |
| 236. වෙනත් | 3,794,516.75 | 1,951,254.69 |
| **එකතුව** | **8,242,687.29** | **6,566,071.17** |

සටහන් 12

| | | |
|---|---|---|
| **210. සමුච්චිත අරමුදල් හා සංචිත** | | |
| 211. සමුච්චිත අරමුදල | 110,863,955.68 | 78,786,162.93 |
| 212. ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම | 336,369,535.88 | 286,861,157.18 |
| **එකතුව** | **447,233,491.56** | **365,647,320.11** |

සටහන් 13

| | | |
|---|---|---|
| **220. ණය ප්‍රාග්ධනය** | | |
| 221. දේශීය ණය සංවර්ධන අරමුදල | 12,055,112.91 | 13,397,459.14 |
| එකතුව | 12,055,112.91 | 13,397,459.14 |

05-529

# විවිධ දැන්වීම්

**අකුරණ ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂයේ පෙබරවාරි මස 28 වැනි දින තීරණ පොතෙහි තීරණ අංක 195/2017 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2017 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එස්. රාජපක්ෂ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2017 මැයි මස 02 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2017 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

| | I වැනි තීරුව<br>*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් අනුව* | II වැනි තීරුව<br>*ගෙවිය යුතු බද්ද රු. ශත* |
|---|---|---|
| (i) | රු. 6000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| (ii) | රු. 6000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90.00 |
| (iii) | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180.00 |
| (iv) | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360.00 |
| (v) | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200.00 |
| (vi) | රු. 1,50,000 ඉක්මවන විට | 3,000.00 |

01 මෝටර් රථ ධාවන පථයක් පවත්වාගෙන යාම,

02 වායු තුවක්කු අලෙවි කිරීම.

05-601/2

---

## අක්කරපත්තුව මහ නගර සභාව

### බලපත්‍ර ගාස්තු හා බදු මුදල් සම්බන්ධ දැන්වීම්

සහ නගර සභා ආඥපනතේ 252 වැනි පරිච්ඡේදයේ 247 (ආ),247 (ඇ) (247B , 247C) සහ අනෙකුත් උපවගන්ති ප්‍රකාර ගන්නා ලද අංක 2017/06(VI) හා 2017.01.30 වැනි දින දරන ලද මූල්‍යමය තීරණය අනුව අක්කරපත්තුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත නම් සඳහන් ස්ථාන වෙනුවෙන් බලපත්‍ර ගාස්තු හෝ බදු මුදල් සහ වාහන, සතුන් වෙනුවෙන් වූ බදු මුදල් උපලේඛනයේ දක්වා ඇති පරිදි 2017 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කරන බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එල්. එම්. අස්මි.
මහ නගර සභා කොමසාරිස්,
මහ නගර සභාව,
අක්කරපත්තුව.

2017 ජනවාරි මස 27 වැනි දින,

**බලපත්‍ර ගාස්තු**

*උපලේඛණය - 1*

| | | *රු. ශත* |
|---|---|---|
| 1 | කෑම කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 2 | කෑම කඩයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 3 | වී වෙළඳාම කිරීම | 3,000 0 |
| 4 | ලැගුම් පහසුකම් සහිත නිවාසයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 5 | බේකරියක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 6 | ආහාර සැපයීම | 3,000 0 |
| 7 | ආහාර ශාලාව | 5,000 0 |
| 8 | ආහාර පොදි කිරීම හා විකිණීම | 1,000 0 |
| 9 | විවේකාගාරයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 10 | රස කරවන පාන නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 11 | ග්‍රෝස් එකට වඩා වැඩියෙන් රස කරවන පාන තියා ගැනීම | 1,000 0 |
| 12 | පිනි කැටය නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 1,000 0 |

| | | රු. ශත |
|---|---|---|
| 13 | පිනි කැටය වෙළෙඳාම් කිරීම | 1,000 0 |
| 14 | අයිස් ක්‍රීම් හා සිසිල් බීම විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 15 | අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 16 | රස කැවිලි නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 17 | රස කැවිලි, ටොෆි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 18 | පළතුරු පාන නිෂ්පාදනය කිරීම, විකිණීම | 1,000 0 |
| 19 | පළතුරු විකිණීම | 1,000 0 |
| 20 | එළවළු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 21 | අමුත්තන් නිවාසයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 22 | කිරි හල පවත්වාගෙන යාම | 1,000 0 |
| 23 | කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 24 | හරක් මස් කඩයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 25 | එළු මස් කඩයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 26 | වෙළෙඳාම සඳහා කුකුල් මස් තියා ගැනීම | 1,500 0 |
| 27 | මාළු විකුණන කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 28 | මාළු පදම් කිරීම | 5,000 0 |
| 29 | ශීත කළ මාළු හා මස් තියා ගැනීම | 1,000 0 |
| 30 | සත්ව ආහාර කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 31 | කුකුල් ආහාර නිෂ්පාදනය කිරීම හා විකිණීම | 1,000 0 |
| 32 | එළු හා හරක් හම් පදම් කර විකිණීම | 1,000 0 |
| 33 | කුකුල් 300ට වඩා වැඩියෙන් කුකුල් ගොවිපළක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 34 | සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 35 | පක්ෂීන් ඇති කිරීම | 1,000 0 |
| 36 | මුහුදු කුඩැල්ලන් ඇල්ලීම | 3,000 0 |
| 37 | කුකුල් හා සත්ව ආහාර නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 38 | මුහුදු කුඩැල්ලා පදම් කිරීම | 2,000 0 |
| 39 | හිසකෙස් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 40 | රෙදි සෝදන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 41 | පපඩම් නිෂ්පාදනය කිරීම හා තියා ගැනීම | 1,000 0 |
| 42 | පිදුරු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 43 | හිස් බෝතල්, ගෝනි එකතු කිරීම | 1,000 0 |
| 44 | පරණ පුවත්පත් එකතු කිරීම හා විකිණීම | 1,000 0 |
| 45 | කොස්ස හෝ ඉරටු ඉදල් නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 46 | ගිනි පෙට්ටි නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 47 | පුවත්පත් කඩයක් හෝ බෙදහැරීම් | 1,000 0 |
| 48 | සබන් නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 49 | කපුරු නිෂ්පාදනය කිරීම | 500 0 |
| 50 | දුම් පෝරණු තියා ගැනීම | 1,000 0 |
| 51 | සුරුට්ටු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 52 | කරවල එකතු කිරීම හා විකිණීම | 1,000 0 |
| 53 | පොල්අතු විකිණීම | 1,000 0 |
| 54 | යෝගට් නිෂ්පාදනය කිරීම හා විකිණීම | 1,000 0 |
| 55 | පිගන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළෙඳම් කිරීම හෝ ඒවා ඔප කිරීම | 1,000 0 |
| 56 | බීඩී, සුරුට්ටු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,500 0 |
| 57 | පුයර හා සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 58 | පොල් කොහු හෝ වෙනත් කොහු නිෂ්පාදනය කිරීම හෝ එකතු කිරීම | 1,000 0 |
| 59 | පොල් එකතු කිරීම හෝ විකිණීම | 1,000 0 |
| 60 | යන්ත්‍රයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 61 | කොප්පරා නිෂ්පාදනය කිරීම හෝ තියා ගැනීම | 1,000 0 |
| 62 | ගැලුම් 50 ට වඩා වැඩියෙන් පොල්තෙල් තියා ගැනීම | 1,000 0 |

| | | රු. ශත |
|---|---|---|
| 63 | රන් ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 64 | ආභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 2,000 0 |
| 65 | ආභරණ වෙළෙඳාම කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 66 | අරක්කු හෝ පිටරට මත්පැන් ශාලා හෝ වෙළඳසල් පවත්වාගෙන යාම | 3,000 0 |
| 67 | රා එකතු කිරීම හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 68 | මෝටර් රථ වෙළෙඳාම් කිරීම | 5,000 0 |
| 69 | යතුරුපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 70 | මෝටර් අමතර කොටස් වෙළෙඳාම් කිරීම | 1,500 0 |
| 71 | පාපැදි අමතර කොටස් වෙළෙඳාම් කිරීම | 1,000 0 |
| 72 | 25 ට වඩා වැඩියෙන් අළුත් හෝ පරණ ටයර් තියා ගැනීම | 1,000 0 |
| 73 | පාපැදි අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 74 | යතුරුපැදි අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 75 | මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 76 | මෝටර් රථ නඩත්තු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 77 | මෝටර් රථ ටයර් වෙළෙඳාම කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 78 | මෝටර් රථ සඳහා බොඩි සෑදීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 79 | බැටරි නැවත ශක්තිමත් කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 80 | ටයර් හා ටියුබ් වෙල්කනයිසිං කිරීම | 1,500 0 |
| 81 | ටයර් නැවත පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 82 | අළුත් පාපැදි වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 83 | වාහන දුම් පරීක්ෂණය | 5,000 0 |
| 84 | මෝටර් වාහන හරි ගැස්සීම | 1,500 0 |
| 85 | මෝටර් වාහන පැදවීමේ පුහුණු ස්ථානයක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 86 | කුලියට වාහන සැපයීම | 5,000 0 |
| 87 | නෙට් කැෆේ | 1,000 0 |
| 88 | පරිගණක පුහුණු කරවන, උගන්වන ස්ථානයක් පවත්වාගෙන යාම | 4,000 0 |
| 89 | පාසල් උපකරණ නිෂ්පාදනය කිරීම හා විකිණීම | 1,500 0 |
| 90 | පාසල් පොත් හා ලිපිද්‍රව්‍ය එක්රැස් කිරීම හා විකිණීම | 1,000 0 |
| 91 | ඡායා පිටපත් කිරීමේ කඩයක්/කොමියුනිකේෂන් පවත්වාගෙන යාම | 1,000 0 |
| 92 | ඡායාරූප හා ලැමිනේටිං | 1,000 0 |
| 93 | පරිගණක යතුරුලියන හා මුද්‍රණය | 1,000 0 |
| 94 | ඡායාරූප ස්ටුඩියෝ පවත්වාගෙන යාම | 1,000 0 |
| 95 | සින්දු හා සංගීත තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 96 | ලේඛනගත කිරීම/ඡායාරූප ගැනීම | 3,000 0 |
| 97 | ඩිජිටල් ප්‍රින්ටින් (Digital Printing) | 3,000 0 |
| 98 | ජංගම දුරකථන වෙළෙඳ ආයතනයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 99 | ජංගම දුරකථන අළුත්වැඩියාව | 1,000 0 |
| 100 | ජංගම දුරකථන අමතර කොටස් විකිණීම | 1,000 0 |
| 101 | ස්ථිර ජංගම දුරකථන වෙබ් අඩවිය | 12,000 0 |
| 102 | වෛද්‍ය විශේෂඥයන්ගේ උපදෙස් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 103 | පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 2,500 0 |
| 104 | පෞද්ගලික බටහිර ආයුර්වේද වෛද්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 105 | බටහිර ඖෂධ වර්ග වෙළෙඳාම් කිරීම | 2,500 0 |
| 106 | ආයුර්වේද බෙහෙත් වර්ග වෙළෙඳම් කිරීම | 1,500 0 |
| 107 | දත් වෛද්‍ය ශාලාවක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 108 | ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම | 1,500 0 |
| 109 | වෛද්‍ය පර්යේෂණාගාර | 3,000 0 |
| 110 | උපදෙස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 111 | ඇස් කණානාඩි කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |

| | | රු. ශත |
|---|---|---|
| 112 | වී, හාල්, පිටි අඹරන මෝලයක් තියා ගැනීම | 1,000 0 |
| 113 | මිරිස්, කෝපි අඹරන මෝලයක් තියා ගැනීම | 1,000 0 |
| 114 | අශ්වබල 20ට වඩා වැඩි හාල් මෝල පවත්වාගෙන යාම | 5,000 0 |
| 115 | ගෘහ භාණ්ඩ | 2,000 0 |
| 116 | තොග වෙළඳාම සඳහා හොණ්. 10 ට වඩා වැඩියෙන් පිටි, ලුණු, සීනි, හාල් තියා ගැනීම | 1,500 0 |
| 117 | හොණ්. 03 ට වඩා වැඩියෙන් තේ එකතු කිරීම | 1,000 0 |
| 118 | කුළුබඩු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 119 | හාල් විකිණීම | 1,000 0 |
| 120 | ප්ලාස්ටික් භාණ්ඩ විකිණීම | 1,500 0 |
| 121 | ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 1,500 0 |
| 122 | පී වී සී නළ හෝ එයින් නිෂ්පාදිත භාණ්ඩ තියා ගැනීම හා විකිණීම | 1,500 0 |
| 123 | යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 124 | යාන්ත්‍රික යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 125 | යකඩ භාණ්ඩ වෙළෙඳාම කිරීම හෝ තියා ගැනීම | 1,500 0 |
| 126 | පරණ යකඩ භාණ්ඩ වෙළඳාම කිරීම හෝ තියා ගැනිම | 1,500 0 |
| 127 | වෙල්ඩිං ගරාජයක්, ටිංකරිං පවත්වාගෙන යාම | 2,000 0 |
| 128 | දගරම් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 129 | ලියවන පට්ටල තීන්ත ගාන ස්ථානයක් පවත්වාගෙනයාම | 3,000 0 |
| 130 | ස්ප්‍රේ පෙයින්ටිං ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 131 | අච්චුවට ලෝදිය වක්කරන කම්හලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 132 | විදුලි  භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 1,500 0 |
| 133 | විදුලි භාණ්ඩ වෙළඳාම කිරීම | 2,000 0 |
| 134 | විදුලි භාණ්ඩ හා පංකා මෝටර් අළුත්වැඩියා කිරීම | 1,000 0 |
| 135 | ශීතකරණ නිෂ්පාදනය කිරීම හා අළුත්වැඩියා කිරීම | 1,000 0 |
| 136 | රූපවාහිනි හා ගුවන්විදුලි අළුත්වැඩියා කිරීම | 1,000 0 |
| 137 | රූපවාහිනි හා ගුවන් විදුලි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 138 | රූපවාහිනි, ගුවන්විදුලි, මහන මැෂින් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 139 | වතුර පොම්ප නිෂ්පාදනය කිරිම | 3,000 0 |
| 140 | පරිගණක අමතර කොටස් විකිණීම | 1,500 0 |
| 141 | පරිගණක අළුත්වැඩියා කිරීම, සර්විස් කිරීම | 1,000 0 |
| 142 | යතුරු ලියන හා පිටපත් කිරීමේ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම | 1,000 0 |
| 143 | ඔරලෝසු අළුත්වැඩියා කිරීම | 1,000 0 |
| 144 | භාවිතා කළ යතුරුපැදි විකිණීම | 2,000 0 |
| 145 | ශබ්ද විකාශනය හා උපකරණ විකිණීම | 5,000 0 |
| 146 | යන්ත්‍රයෙන් ලී ඉරන මෝලක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 147 | අතින් ලී ඉරන හලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 148 | වඩු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 149 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම කිරීම | 1,500 0 |
| 150 | ලී ගබඩා හෝ කඩයක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 151 | ලී ලෑලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 152 | දර ගබඩා හෝ කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 153 | ඉරි ලී වෙළඳාම කිරීම | 1,500 0 |
| 154 | ලී බඩු සඳහා වර්ණ ගැන්වීම | 3,000 0 |
| 155 | රෙදිපිළි වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,500 0 |
| 156 | අත්යන්ත්‍ර රෙදිපිළි තියා ගැනීම | 2,000 0 |
| 157 | කුෂන් වැඩ කිරීම | 1,500 0 |
| 158 | රෙදිපිළිවලට සායම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 1,000 0 |
| 159 | කමිස, ඇඳුම් නිෂ්පාදනය කිරීමේ ස්ථානය පවත්වාගෙන යාම | 1,000 0 |
| 160 | මැහුම් කඩයක්  පවත්වාගෙන යාම | 1,000 0 |
| 161 | නිම කළ, නිෂ්පාදිත ඇඳුම් වෙළෙඳාම කිරීම | 1,000 0 |

| | | රු. ශත |
|---|---|---|
| 162 | මෙට්ට නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙනයාම | 1,000 0 |
| 163 | නූල් වෙලඳ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 164 | ඇඳුම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 165 | ඇඳුම් කම්හලක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 166 | සිමෙන්තියෙන් නිෂ්පාදිත භාණ්ඩ හෝ නිෂ්පාදනය කරන ස්ථාන පවත්වාගෙන යාම | 1,500 0 |
| 167 | ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම කිරීම හෝ තියා ගැනීම | 1,500 0 |
| 168 | පොදි 25 ට වඩා වැඩියෙන්සිමෙන්ති තියා ගැනීම හෝ වෙළඳාම කිරීම | 1,500 0 |
| 169 | ගඩොල් හෝ උළු ගබඩා කිරීම | 1,500 0 |
| 170 | සිමෙන්ති ගල්, වැලි මිශ්‍රකළ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා විකිණීම | 1,500 0 |
| 171 | පිඟන් භාණ්ඩ විකිණීම | 2,500 0 |
| 172 | හුණු හෝ හුණු ගල් තියාගැනීම | 1,000 0 |
| 173 | ගැලුම් 5ට වඩා වැඩියෙන් තීන්ත වාර්නිෂ් ගෑම තියා ගැනීම | 1,500 0 |
| 174 | තීන්ත වාර්නිෂ්ගෑම වෙළඳාම් කිරීම | 1,500 0 |
| 175 | මිනි සිනෙමා පෙන්වන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 176 | පැට්‍රල්, ඩීසල්, භූමිතෙල් වෙළෙඳ සැල පවත්වාගෙන යාම | 3,000 0 |
| 177 | පැට්‍රල්, ඩීසල්, ඛනිජ තෙල් තියාගැනීම | 2,000 0 |
| 178 | පොහොර හෝ රසායනික පොහොර තියාගැනීම හෝ නිෂ්පාදනය කිරීම | 2,000 0 |
| 179 | කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ තියාගැනීම | 2,000 0 |
| 180 | හම් භාණ්ඩ හෝ සපත්තු නිෂ්පාදනය කිරීම | 2,000 0 |
| 181 | පාවහන් වෙළඳාම් කිරීම | 1,500 0 |
| 182 | සුඛෝපභෝගී භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 183 | අතින් ක්‍රියාත්මක කරන අච්චු මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 184 | පරිගණක වෙළඳාම් කිරීම | 2,000 0 |
| 185 | විදුලියෙන් ක්‍රියාත්මක කරන අච්චු මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 186 | ගබඩාවක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 187 | ලොඩර් තියාගැනීම | 5,000 0 |
| 188 | කඩුන්ඩි තියාගැනීම | 5,000 0 |
| 189 | ගොයම් කපන මැෂින් තියාගැනීම | 5,000 0 |
| 190 | සාමාන්‍ය ප්‍රචාර සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 191 | සංචාර ගමනාගමන සේවයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 192 | විදේශ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 193 | නියෝජිත ස්ථාන | 5,000 0 |
| 194 | තොග වෙළඳාම | 5,000 0 |
| 195 | ගෘහ අලංකරණය/සුවඳ විලවුන් | 3,000 0 |
| 196 | මුදල් තැන්පතුව හා ආපසු ගැනීම | 5,000 0 |
| 197 | ණය ලබා දීම | 5,000 0 |
| 198 | ස්ථාවර තැන්පතුව/ආයෝජනය | 5,000 0 |
| 199 | උකස් කිරීම | 5,000 0 |
| 200 | බදු දීම | 5,000 0 |
| 201 | මුදල් හුවමාරු සේවාව | 3,000 0 |
| 202 | ගුවන් ටිකට්පත් ලියාපදිංචි නියෝජිත ස්ථාන | 3,000 0 |
| 203 | ආලෝක, ශබ්ද සම්බන්ධ උපකරණ කුලියට දීම | 1,000 0 |
| 204 | විශේෂ උත්සවය සඳහා වූ භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 205 | රූපවාහිනී සිනෙමා තැටි විකිණීම හා කුලියට දීම | 2,000 0 |
| 206 | ශබ්ද විකාශනය කුලියට සැපයීම | 3,000 0 |
| 207 | වීදුරු භාණ්ඩ තියා ගැනීම හෝ නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 208 | වීදුරු නිෂ්පාදනය කිරීම හා විකිණීම | 1,000 0 |
| 209 | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 210 | ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා විකිණීම | 2,000 0 |

| | | රු. ශත |
|---|---|---|
| 211 | සුළු ප්‍රමාණයෙන් ඇලුමිනියම් භාණ්ඩ විකිණීම | 1,000 0 |
| 212 | කොන්ක්‍රීට් නළ, කොටු හා ග්‍රීල් නිෂ්පාදනය කිරීම | 2,000 0 |
| 213 | කොන්ක්‍රීට් විදුලි කණු නිෂ්පාදනය කිරීම | 2,000 0 |
| 214 | පුපුරන ද්‍රව්‍ය භාවිතා කිරීම හා ගල් කැඩීම | 5,000 0 |
| 215 | ගිරවල් හෝ ගල් කඩන මෝලක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 216 | වෙඩි, රතිඤ්ඤා නිෂ්පාදන කම්හලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 217 | කොමිස් නියෝජිතයා | 1,500 0 |
| 218 | ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු | 5,000 0 |
| 219 | මුදල් ණයට දෙන්නා | 5,000 0 |
| 220 | තැරැව්කරු, මඟුල් කපුවා | 3,000 0 |
| 221 | ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලැස්ම සකස්කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 222 | විගණන කටයුතු ස්ථානයක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 223 | වෙන්දේසිකරු | 5,000 0 |
| 224 | ආයෝජනය කරන්නා | 5,000 0 |
| 225 | පෞද්ගලික අධ්‍යාපනායතනයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 226 | රක්ෂණ කිරීමේ නියෝජිතයා | 3,000 0 |
| 227 | සංචාරක බස් සේවය තියා ගැනීම | 5,000 0 |
| 228 | පොදු ප්‍රවාහන සේවය කරන්නා | 5,000 0 |
| 229 | උකසට ගන්නා | 5,000 0 |
| 230 | දේශීය හා විදේශීය බැංකු | 5,000 0 |
| 231 | රක්ෂණ ආයතනය | 5,000 0 |
| 232 | රූපවාහිනී විකාශන ස්ථානයක් පවත්වාගෙන යාම | 8,000 0 |
| 233 | ගුවන් විදුලි විකාශන ස්ථානයක් පවත්වාගෙන යාම | 5,000 0 |
| 234 | පිරිසිදු කරන සේවය | 3,000 0 |
| 235 | ව්‍යායාම ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 236 | වාහන ආසන වෙන් කිරීම | 1,000 0 |
| 237 | කෙළි භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා විකිණීම | 2,000 0 |
| 238 | ඉඩම් විකිණීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 239 | ශ්‍රමයට මිනිස් සම්පත් හෝ කම්කරුවන් සැපයීම | 3,000 0 |
| 240 | ප්‍රදර්ශනාගාර | 5,000 0 |
| 241 | බිල්පත් ගෙවීම | 2,000 0 |
| 242 | ආහාර සැපයීම් ඇති උත්සව ශාලාව සලස්වා දීම | 3,000 0 |
| 243 | මනාලිය සැරසුම | 3,000 0 |
| 244 | කාන්තා හිසකෙස් කැපීම | 2,000 0 |

**වාහන, සතුන් සඳහා වූ බදු මුදල්**

***උපලේඛනය - 2***

| | | රු. ශත |
|---|---|---|
| 1. | කාර්, මෝටර් ත්‍රී රෝද, මෝටර් ලොරි, මෝටර් සයිකල්, ජින්රික්ෂෝ, පාපැදි ත්‍රී රෝද හැර අනෙකුත් වාහන | 50 0 |
| 2. | සෑම සයිකලය | 20 0 |
| 3. | සෑම පාපැදි හෝ ත්‍රිරෝද, සයිකල් කාර් | 50 0 |
| 4. | සෑම කරත්තය | 50 0 |
| 5. | ලියාපදිංචි ත්‍රීරෝද රථ දයක මුදල (මාසිකව) | 500 0 |
| 6. | සෑම අත් කරත්තය | 15 0 |
| 7. | සෑම ජින්රික්ෂෝ | 30 0 |
| 8. | සෑම අශ්වයකු හෝ කොටළුවකු | 20 0 |
| 9. | හරක් 10ට වඩා වැඩියෙන් තියා ගැනීම | 140 0 |
| 10. | සෑම අලියකු | 70 0 |

**බලපත්‍ර ගාස්තු හා වෙළඳ බදු ලැයිස්තුව**

*උපලේඛනය - 3*

| | | රු. | ශත |
|---|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවූ ලැබීම් | 1,500 | 0 |
| 2. | රු. 6,001 ට වැඩි හා රු. 12,000 නොඉක්ම වූ ලැබීම් | 2,500 | 0 |
| 3. | රු. 12,001 ට වැඩි හා රු. 24,000 නොඉක්ම වූ ලැබීම් | 3,000 | 0 |
| 4. | රු. 24,001 ට වැඩි හා රු. 48,000 නොඉක්ම වූ ලැබීම් | 4,000 | 0 |
| 5. | රු. 48,001 ට වැඩි හා රු. 96,000 නොඉක්ම වූ ලැබීම් | 4,500 | 0 |
| 6. | රු. 96,001 ට වැඩි හා රු. 1,92,000 නොඉක්ම වූ ලැබීම් | 5,000 | 0 |

**බලපත්‍ර ගාස්තු හා වෙළෙඳ බදු ලැයිස්තුව**

*උපලේඛනය - 4*

| | | | |
|---|---|---|---|
| 1. | දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම (වර්ග අඩි) (සතියකට) | 50 | 0 |
| 2. | ඉලක්ට්‍රොනික් දැන්වීම් 15 Sec - එක් වතාවක් | 20 | 0 |
| 3. | ළමා උද්‍යාන ප්‍රවේශපත්‍ර ගාස්තු (වයස අවු. 8 දක්වා) | 20 | 0 |
| 4. | දැන්වීම් පුවරුව - පෞද්ගලික ස්ථානයේ (වර්ග අඩි) ( Shop name board) | 50 | 0 |
| 5. | දැන්වීම් පුවරුව - පොදු/මහ නගර සභාවට අදාළ ස්ථාන | 150 | 0 |

05-437

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.